21/0464/305/012

(26)

# බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
# புத்தசாசனம், மத மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
# Ministry of Buddhasasana, Religious and Cultural Affairs

මගේ අංකය / எனது இல. / My No. MBRCA/01/07/12/01/2021

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021.03.12

රහසයයි.

අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය: MBRCA/01/07/2021/CP/06

ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

**අධිකරණ ක්‍රියාමාර්ග හා විමර්ශන කටයුතු සිදුකරමින් පවතින හීලෑ අලි ඇතුන් සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම හා සන්තකය පැවරීම.**

1.0 හැඳින්වීම

1.1 හීලෑ අලි ඇතුන් යනු අනාදිමත් කලෙක සිට මෙරට සමාජය හා සබැඳිව විවිධ වූ ආර්ථික, සමාජයීය හා සංස්කෘතික කටයුතුවලට දායක වූ සත්ත්ව කොට්ඨාසයකි. ශ්‍රී ලාංකික සමාජයෙහි ලිඛිත හා ජනශ්‍රැති ඉතිහාසය තුළ වසර දහස් ගණනක සිට හීලෑ ඇතුන් විවිධ ආගම හා සංස්කෘතික උත්සව සඳහා ද, ආර්ථික කටයුතු සඳහා ද යොදා ගත් ආකාරය විද්‍යමාන වේ. වර්තමාන සමාජය තුළ පෙරහැර මංගල්‍යයන් සඳහා අලි ඇතුන් අත්‍යවශ්‍ය වන අතර මෙයට අමතරව විවිධ වූ සංස්කෘතික උත්සව හා සංචාරක කර්මාන්තය ආදි ආර්ථික කටයුතු වෙනුවෙන් අලි ඇතුන් යොදා ගැනීම අඛණ්ඩව සිදුවේ.

1.2 නමුත් වර්තමානයේ මෙරට සිටින හීලෑ අලි ඇතුන් සංඛ්‍යාව ශීඝ්‍රයෙන් අඩුවී යාම මෙම කටයුතු වලට බලවත් තර්ජනයක් වී ඇත. ඒ අනුව දැනට සිටින හීලෑ අලි ඇතුන් සංඛ්‍යාව 210 ක් වන අතර එම සංඛ්‍යාවෙන් 102 දෙනෙකු ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව භාරයේ සිටින අතර ඉතිරි 108 දෙනා පෞද්ගලික හිමිකාරිත්වයන් යටතේ සිටී. පෞද්ගලික හිමිකාරිත්වයන් යටතේ සිටින අලි ඇතුන් ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයේ පවතින අඩුපාඩු මත පසුගිය වකවානුවේ පෞද්ගලික හිමිකාරිත්වයන් යටතේ සිට අලි ඇතුන්ගෙන් 49 දෙනෙකු වෙනුවෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම මත 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉන් 38 දෙනෙකු ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ රඳවා තබා ඇත.

1.3 මෙම තත්ත්වය පෙරහැර මංගල්‍යයන් මෙන්ම ආර්ථික කටයුතු කෙරෙහි ද අහිතකර ලෙස බලපා ඇති අතර මෙම අලි ඇතුන් බොහෝමයකගේ හිමිකාරිත්වය දැරූ මහා සංඝරත්නයට හා විහාර දේවාල වලට අයත් ප්‍රභූන් ඇතුළු විවිධ පුද්ගලයින්ට අධිකරණ ක්‍රියාමාර්ග තුළ සැකකරුවන් හා චූදිතයින් බවට පත් වී සිටීමට සිදු වී ඇත.

අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07. இல. 135, ஸ்ரீமான் அனகாரிக தர்மபால மாவத்தை, கொழும்பு 07.
No. 135, Sreemath Anagarika Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office 011-2307604, 011-2307674
ෆැක්ස් / தொலைநகல் / Fax 011-2307688, 011-2300513
වෙබ් අඩවිය / இணையத்தளம் / Website http://www.mbs.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail info@mbs.gov.lk
ලේකම් / செயலாளர் / Secretary 011-2307430, Fax: 011-2307409, E-mail: mbsecoffice@gmail.com

## 2.0 සාධාරණීකරණය

2.1 මේ දක්වා මෙරට තුළ හීලෑ අලි ඇතුන් ලියාපදිංචි කිරීමට අදාලව නීත්‍යානුකූල ක්‍රමවේදයක් නොමැති අතර 1991.05.14 දිනැති අංක 662/4 දරණ සඳහන් ගැසට් පත්‍රය ද පාර්ලිමේන්තුව වෙතින් අනුමැතිය ලැබී නොමැති බැවින් බල රහිත වන බැවින් අලි ඇතුන්ගේ ලියාපදිංචිය සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම නීත්‍යානුකූල නොවන බව නිරීක්ෂණය වේ. එමෙන්ම මෙම අලි ඇතුන් දීර්ඝ කාලයක සිට එකම ස්ථානයක රඳවා තැබීම මත එම සතුන්ට සිදුවී ඇති පීඩාව ද එම සතුන්ගේ හිමිකරුවන්ට සිදු වී ඇති පීඩා හා ආර්ථික වශයෙන් සිදුවන පාඩුව ද සලකා බලා මෙම සතුන් සම්බන්ධව නොපමාව ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සුදුසු බව පෙනේ.

## 3.0 නිරීක්ෂණ

3.1 මේ සම්බන්ධව පවතින නීතිමය ගැටලුව ලෙස දක්වා ඇත්තේ 1964 අංක 44 හා 1970 අංක 01 (469 අධිකාරිය) සංශෝධිත වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනතේ 22 'අ' හා 71 වගන්ති ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදැයි ප්‍රකාශිත 1991.05.14 දිනැති අංක 662/4 දරණ ගැසට් පත්‍රය අනුව මෙම අලි ඇතුන් ලියාපදිංචි කර නොතිබීම වේ (මෙම ගැසට් නිවේදනය සඳහා 1993 හා 2009 සංශෝධන අදාල නොවේ). නමුත් අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද දේශපාලන පළිගැනීම් පිළිබඳ කොමිසමේ දී හා කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණයේ දී (නඩු අංක HC (TAB) 504/2019) පාර්ලිමේන්තු මහ ලේකම් විසින් ලිඛිත ව හා වාචිකව දන්වා ඇත්තේ 1991.05.14 දිනැති අංක 662/4 දරණ ගැසට් පත්‍රය 1964 අංක 44 හා 1970 අංක 01 (469 අධිකාරිය) සංශෝධිත වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනතේ 22 'අ' හා 71 වගන්ති ප්‍රකාර ව පාර්ලිමේන්තුව වෙතින් අනුමැතිය ලැබී නොමැති බල රහිත ගැසට් පත්‍රයක් බවය.

3.2 මෙම සතුන් දීර්ඝ කාලයක් තුළ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ රඳවා තැබීම මත පහත ගැටලු ද මතු වී ඇත.

i. රඳවා තබා ඇති ස්ථානයන් හි ඉඩකඩ සීමාසහිත වීම මත සත්ව හිංසනය පිළිබඳ ගැටලු මතුවීම.

ii. මෙම සතුන්ගේ ජෛව විද්‍යාත්මක වෙනස්කම් සහිත කාලවල දී ඔවුන් එකට තබා ගැනීමේ දුෂ්කරතාවය හා ඔවුන්ගේ ස්වභාවික බෝවීමට බාධා සිදුවීම.

iii. දීර්ඝ කාලයක් එක් ස්ථානයක රැඳී සිටීම මත සතුන්ට සිදු වී ඇති පීඩාව.

iv. නඩත්තුව හා රැකබලා ගැනීම වෙනුවෙන් විශාල මහජන මුදලක් වැය කිරීමට සිදුවීම (දළ වශයෙන් එක් සතෙකු වෙනුවෙන් මසකට රුපියල් ලක්ෂ 2 ක් පමණ ද නීතිමය පදනමක් රහිත ව අත්අඩංගුවේ තබාගෙන සිටින අලි ඇතුන් වෙනුවෙන් යථෝක්ත දෙපාර්තමේන්තු විසින් වර්ෂයකට රුපියල් මිලියන 90 ක් පමණ ද වැය කරයි).

v. මෙම සතුන් රැක බලා ගැනීම වෙනුවෙන් මෙම දෙපාර්තමේන්තුවලට අමතර කාර්යයක් ඉටු කිරීමට සිදුවීම මත ඔවුන්ගේ නියමිත රාජකාරියට බාධා පැමිණීම.

3.3 එසේම අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති ඉහත සඳහන් අලි ඇතුන් සම්බන්ධයෙන් පසුගිය රජය මගින් මෙම අධිකරණ ක්‍රියාමාර්ග හා නඩු කටයුතු සමථයකට පත්කිරීමට හෝ ඉවත්කිරීමට අදාළව අංක 19/2690/102/049 දරණ හා 2019.09.10 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් එවකට අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා, බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍ය ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා හා සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි කටයුතු අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මැතිතුමන් විසින් ඉදිරිපත් කරනු ලදුව ඒ සඳහා 2019.10.01 දිනැති ව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති බව ද නිරීක්ෂණය වේ. ඉන්පසු ගරු පරිසර හා වනජීවී සම්පත් අමාත්‍ය එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා විසින් අධිකරණ ක්‍රියාමාර්ග හා විමර්ශන කටයුතු සිදු කරමින් පවතින හීලෑ අලි ඇතුන් නියාමනය සහ සන්තකය පැවරීම නමින් 2019.12.26 දිනෙන් අමාත්‍ය මණ්ඩලය වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදුව, ඒ සඳහා 2020.01.14 දිනයෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් ද ලබා දී ඇත.

4.0 යෝජනා

4.1 2020.01.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර ව එවකට වනජීවී අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් දී ඇති පරිදි කෙටුම්පත් කොට ඇති ක්‍රමවේදය අනුසාරයෙන් දැනට බලපත්‍ර ලබා දී ඇති, සන්නස් පත්‍ර ලබා දී ඇති, බලපත්‍ර නොමැති ආදී වශයෙන් සිටින සියලු ම හීලෑ අලි ඇතුන් නැවත විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීමට විෂය භාර අමාත්‍යවරයා වන වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා වෙත පැවරීම.

4.2 දැනට නීතිමය කටයුතු සිදුකරමින් පවතින හීලෑ අලි ඇතුන් සම්බන්ධ ව සියලු ම නඩු කටයුතු ඉල්ලා අස්කර ගැනීම සිදුකර මෙම සතුන්ගේ සන්තකය පවරනු ලබන කොන්දේසිවලට යටත් ව දැනට හිමිකාරීත්වය දරණ පුද්ගලයන් වෙත ම ලබා දීම.

4.3 ඉහත 4.1 පරිදි නව ක්‍රමවේදය යටතේ හීලෑ අලි ඇතුන් ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම.

5.0 අනුමැතිය

5.1 ඉහත 4.1 , 4.2 හා 4.3 යෝජනා ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරමු.

මහින්ද රාජපක්ෂ (පා.ම)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය
සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය

2021 මාර්තු මස ..12.. දින

ආර්.එම්.සී.බී රත්නායක (පා.ම)
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍ය

2021 මාර්තු මස ...13.... දින

ආර්. එම්. සී. බී. රත්නායක
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍ය
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය
නො. 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය